**හම්බන්තොට මහා නගර සභාව**

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

-----------------------------------

**1 මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 21 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 27 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 31 දින සභාවේ කොමසාරිස්වරයාට යවා ඇත.

**1.2 මතය**

**------**

මෙම වාර්තාවේ 1.3.1 හා 1.3.5 ඡේද වල දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**--------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**------------------------**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු. 944,204 ක් වැඩියෙන්ද, ප්‍රාග්ධන ආධාර සහ කර්මාන්ත ණයහිමි යන ගිණුම්වල ශේෂය රු. 472,102 ක් බැගින් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) ආදායම් ගිණුම් 5 ක ආරම්භක හිඟය සහ ආරම්භක හිඟයෙන් සමාලෝචිත වසරේ ලැබුණු මුදල නිවැරදිව ගිණුම්ගත නොකිරීම නිසා වර්ෂය අවසානයේ ආදායම් ණයගැති ශේෂය හා වසරේ ආදායම රු. 1,549,026 ක් වැඩියෙන් දැක්වුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අනුමත නොකළ කර්මාන්තයක් සඳහා රු.1,116,021 ක ණයහිමි ප්‍රතිපාදන ඇති කිරීම නිසා වර්ෂයේ වියදම හා ණයහිමි ශේෂය සමාන අගයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ පළාත් නිශ්ශිත සංවර්ධන ප්‍රදාන යටතේ කර්මාන්ත 06 ක් සඳහා අනුමත කර තිබුණු මුදල රු. 665,302 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි.

(ඉ) හම්බන්තොට ප්‍රාදේශීය සභාවෙන් මහා නගර සභාවට පවරන ලද රු. 203,209 ක් වූ වත්කම් ශේෂය හා එකතුව රු. 4,262,501 ක් වූ වගකීම් ශේෂ 3 ක් නිරවුල් කරගෙන නොතිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 06 ක ශේෂයන් සහ ඊට අදාළ පොත්පත් හා උපලේඛන වල දැක්වෙන ශේෂයන් අතර රු. 513,977 ක අසමානතා නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු ගිණුම්**

ඉකුත් වර්ෂයට අදාළ රු. 222,130 ක් වූ ගලි බවුසර් ආදායම්, රු. 10,000 ක් වූ බස් රථ ආදායම් සහ රු.36,750 ක් වූ බැකෝ යන්ත්‍ර ආදායම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 ගෙවිය යුතු ගිණුම්**

ආසියානු සංවර්ධන බැංකු ණය මුදල් යටතේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් සපයන ලද යන්ත්‍ර සූත්‍ර වෙනුවෙන් සභාව විසින් ගෙවිය යුතු රු.895,136 ක ණය මුදලින් අර්ධ වාර්ෂික වාරික 11 ක ගෙවීම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අක්‍රීයව පැවතුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු.101,660 ක් වූ ක්‍රීඩා උපකරණ සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණ වාර්තා, උපයෝගී ලේඛන හා උපලේඛනද, එකතුව රු.1,439,414 ක් වූ හිඟ හිටි විදුලි ගාස්තු හා රජයේ ප්‍රාග්ධන ආධාර සම්බන්ධයෙන් උපයෝගී ලේඛන, උපලේඛන හා කාල විශ්ලේෂණද, රු.108,855 ක් වූ සංවර්ධන සංචිත සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ, උපයෝගී ලේඛන හා අදාළ තොරතුරුද, ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

පහත විස්තර දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | කල් ඉකුත් වූ රු. 2,843,382 ක තැන්පත් ශේෂ 18 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 07 වන වගන්තිය | යොමුගත විධිවිධාන වලට අනුකූල නොවී සභාව විසින් සේවකයන් 15 දෙනෙකු බඳවා ගෙන 2015 සැප්තැම්බර් සිට 2016 පෙබරවාරි දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් එකතුව රු. 1,589,297 ක් වැටුප් හා දීමනා ලෙස සභා අරමුදලින් ගෙවා තිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,118,444 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 7,071,810 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,953,366 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී ස්වයං උත්පාදන ආදායම ඉක්මවා ගිය පුනරාවර්තන වියදම, 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 49 කින් හා 2013 වර්ෂයට සාපේක්ෂව සියයට 133 කින් වැඩි වී තිබුණි.

(ආ) සභාවට ලැබෙන ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් හැකියාවක් නොලැබෙන බවත්, පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් වැඩි වී තිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

----------------------

**2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

---------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය පිළිබඳව පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව බිල්කර තිබුණු රු. මිලියන 30.3 ක මුළු පුනරාවර්තන ආදායමින් රු. මිලියන 24.8 ක් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 82 ක් පමණ විය.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ආදායම්වල එකතුව රු. මිලියන 9.1 ක් වූ අතර, ඉන් රු. මිලියන 4.6 ක් අය වී තිබුණි. ඒ අනුව හිඟ ආදායම් අය කිරීමේ ප්‍රගතිය සියයට 50 ක් පමණ විය.

**2.3.2 වරිපනම් බදු**

**------------**

සමාලෝචිත වර්ෂය අවසානයට රු. 3,292,501 ක් වූ හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා මහා නගර සභා ආඥා පනතේ 252 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි. 2016 ජූනි 30 වන විට මෙම හිඟය රු.1,637,834 ක් දක්වා අඩු කරගෙන ඇති බව නාගරික කොමසාරිස් විසින් 2016 ජූලි 28 දින මා වෙත වාර්තා කර තිබුණි.

**2.3.3 බදු කුලී**

**---------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) හිඟ ආදායම්**

**------------**

ඉකුත් වර්ෂය අවසානයට හිඟ කඩකුලී ආදායම රු.2,877,739 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට එම හිඟය රු. 3,416,822 ක් දක්වා වර්ධනය වී තිබුණද, මහා නගර සභා ආඥා පනතේ 253 (1) වගන්තිය ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**(ආ) ගිවිසුම් යාවත්කාලීන නොකිරීම හා අතුරු බදුදීම**

**---------------------------------------------------**

(i) 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ, 05 හා 06 ඡේද ප්‍රකාර, තිස්ස පාර කඩකාමර 10 හි ගිවිසුම් යාවත්කාලීන කිරීමට හා තක්සේරුගත බදු මුදල සංශෝධනය කිරීමට 2016 පෙබරවාරි 26 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ii) යථෝක්ත චක්‍රලේඛයේ 12 (I), (II) හා (III) යන ඡේද වල සඳහන් විධිවිධාන වලට අනුකූල නොවී බදුකරුවන් විසින් එම කඩ කාමර බාහිර පාර්ශවයන්ට දීර්ඝ කාලයක සිට අතුරු බදු දී තිබුණි.

**(ඇ) රුහුණු ප්ලාසා ගොඩනැගිල්ලේ දෙවන මහල බදු දීම**

**----------------------------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2007 අගෝස්තු 01 දින එළඹ තිබූ ගිවිසුම 2012 ජූලි 31 දිනට අවලංගු වී තිබූ නමුත්, විවෘත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකර සභා තීරණයක් මත 2013 වර්ෂයේ සිට මෙම මහල නවීකරණය කර ගිමන්හලක් පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිල්ලේ පළමු මහල බදුගත් බදුකරුටම දීර්ඝ කාලීන බදු පදනම මත බදු දී තිබුණි.

(ii) 2016 පෙබරවාරි 26 දින දක්වාම බදුකරු සමඟ ගිවිසුම්ගත වී නොතිබූ අතර, එක්වන් මුදල් හෝ ආරක්ෂිත ඇප තැන්පතුවක් ලබා නොගෙන සභාවේ අධීක්ෂණයකින් තොරව සභාව සතු දේපලක නවීකරණ කටයුතු සිදු කිරීමට බදුකරුට ඉඩ සලසා දී තිබුණි.

**2.3.4 මුද්දර ගාස්තු**

-------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 1,775,774 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-------------------------

**3.1 කාර්යසාධන ඇගයීම**

---------------------

2015 වසරේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අනුමත කරන ලද රු. 999,115 ක් වූ කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු හා පොළොව සැකසීමේ කර්මාන්තයේ ඇස්තමේන්තු අනුමත කිරීමේ ප්‍රමාදය හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.

**3.2 බලය නොලත් ගනුදෙනු**

------------------------

2015 මැයි 21 දිනැති අංක 15/විවිධ (051) දරන අමාත්‍ය මණ්ඩල තීරණයට සහ මහා නගර සභා ආඥා පනතේ 188 වගන්තියට අනුකූල නොවී හම්බන්තොට දිස්ත්‍රික්කයේ පළාත් පාලන ක්‍රීඩා උළෙල සඳහා මහා නගර සභා අරමුදලින් රු. 197,048 ක වියදම් දරා තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

-------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වරාය ගම්මානය අසළ ප්‍රජා ශාලා ගොඩනැගිල්ල වටා ප්‍රිස්මය සකස් කිරීම, ගොඩනැගිල්ල ඇතුළත තීන්ත ආලේප කිරීම, ඇතුළත ගෙබිම සකස් කර රතු සිමෙන්ති මැදීම ආදී කාර්යයන් සහ කෙයාර් ගම්මානය අසළ ප්‍රජා ශාලා ගොඩනැගිල්ල වටා ප්‍රිස්මය සකස් කිරීම, දොර ජනෙල් සවි කිරීම, ගෙබිම සකස් කර සිමෙන්ති දැමීම හා ගොඩනැගිල්ල ඇතුළත තීන්ත ආලේප කිරීම ආදී කාර්යයන් අනුමත පිරිවිතරයන්ට අනුව නිසි පරිදි ඉටුකර නොතිබුණි.

(ආ) කෙයාර් ගම්මානය අසළ ප්‍රජා ශාලා ගොඩනැගිල්ල පිළිබඳ 2016 පෙබරවාරි 24 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී බිත්ති වල ඝනකම අඟල් 7 ක් පමණ වූ නමුත්, අඟල් 9 ක් ලෙස ගෙවීම් වාර්තාවල ඇතුළත් කර දැක්වීම නිසා රු. 37,043 ක වැඩිපුර ගෙවීම් සිදුවී තිබුණි.

**3.4 කාර්ය මණ්ඩල කළමනාකරණය**

-------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට මහා නගර සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 21 ක් ද, සේවකයින් 9 දෙනෙකුගේ අතිරික්තයන් පැවති නමුත්, පුරප්පාඩු පිරවීමට හෝ අතිරික්ත සංඛ්‍යාව විධිමත් කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

-----------------------------------

### 4.1 අයවැය පාලනය

-----------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයන් 02 ක රු.38,325,435 ක ඉතිරි කිරීම්ද, ආදායම් විෂයයන් 02 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් රු.45,383,537 ක් සහ ස්වයං උත්පාදන ආදායම් වලින් සියයට 30 ක් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කර නොතිබීමත් යනාදී හේතු නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

--------------------

2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වැඩසටහන් සඳහා විගණකාධිපතිගේ එකඟත්වය ලබාගෙන නොතිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වන විටත් විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

### 4.4 බේරුම් නොකළ බැරකම්

------------------------

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ බේරුම් නොකළ බැරකම් වල මුළු වටිනාකම රු. 7,584,540 ක් වූ අතර, ඉන් රු. 229,477ක් ඉකුත් වර්ෂයට අදාළ බැරකම් විය.

## 5. පද්ධති හා පාලන

-----------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) සේවක මණ්ඩල කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය